ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව

උපාධි වැඩසටහන- 4වන මට්ටම

අවසාන පරීක්ෂණය 2023/2024

**EPU4337- මුල් ළමාවිය හා ප්‍රාථමික වසරවල සිංහල භාෂාව ඉගැන්වීම**

කාලය - පැය දෙකයි. (02)

දිනය - 2025.06.21 වේලාව - ප.ව.01.30 - ප.ව.03.30 දක්වා

---

**පළමු (1) වන කොටසේ සියලුම ප්‍රශ්නවලටද, දෙවන (2) කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට (03) ද පමණක් පිළිතුරු සපයන්න.**

<u>පළමු (1) වන කොටස</u>

01. දරුවෙකුට භාෂාව මැනවින් හැසිරවීමේ කුසලතාව නිසා ඇතිවන ප්‍රයෝජන පහක් (05) ලියන්න.

02. ස්වර ශබ්ද පිළිබඳ ව හැඳින්වීමක් කර, කෙටි ස්වර සහ දීර්ඝ ස්වර ලියා දක්වන්න.

03. ප්‍රාථමික අධ්‍යාපනය ලබන සිසුන්ගේ කියවීමේ කුසලතා වර්ධනය කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග තුනක් (03) සිංහල භාෂාව ඇසුරින් පැහැදිලි කරන්න.

04. ඝෝෂ - අඝෝෂ භේදය ඔබ පාඨමාලාව හදාරන ගුරු ශිෂ්‍යයෙකුට/ ගුරු ශිෂ්‍යාවකට අවබෝධ වන සේ පැහැදිලි කරන්න.

05. උපසර්ග පදාණු යන්න හඳුන්වා උපසර්ග පදාණු සහිත වචන පහක් (05) ලියන්න.

06. වාක්‍යයක් යනු කුමක්දැයි උදාහරණයක් මගින් පැහැදිලි කරන්න.

07. මූර්ධජ "ණ" කාර හා දන්තජ "න" කාර භාවිතය ආශ්‍රිත රීති තුනක් (03) ලියා උදාහරණයක් බැගින් ඉදිරිපත් කරන්න.

08. "ප්‍රාථමික අධ්‍යාපන අවධියේ සිසුන් සම්බන්ධයෙන් තීරණ ගැනීමේ දී වඩාත් ම යෝග්‍ය වන්නේ සම්භවන තක්සේරුකරණයයි." මෙම අදහස සාධාරණීකරණය කරන්න.

ලකුණු 05 X 08 =40



132

## දෙවන (02) කොටස

09. I. "සියුම් මාංශපේශී හා ක්‍රියාකරකම් මගින් දරුවාගේ ඇඟිලිවල මාංශපේශී හොඳින් ශක්තිමත් වේ." දරුවන් තුළ සියුම් මාංශපේශී කුසලතා සංවර්ධනය කරන ආකාරය පිළිබඳ ව මනා අවබෝධයක් ප්‍රාථමික පාසල් ගුරුවරයෙකුට පැවතීමේ අවශ්‍යතාව සිංහල භාෂාව ඇසුරු කරගෙන උදාහරණ ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

II. "ප්‍රාථමික පාසල් සිසුන් සවන්දීමේ කුසලතා සංවර්ධනය කිරීම ඉතාමත් ම වැදගත් ය." ඒ සඳහා ප්‍රාථමික පාසල් ගුරුවරයෙකුට සංවිධානය කළ හැකි ක්‍රියාකාරකම් තුනක් (03) පියවර වශයෙන් ඉදිරිපත් කරන්න.

(ලකුණු 10)

10. I. ගුරුවරයෙකු වශයෙන් ඔබ හඳුනාගෙන ඇති, ප්‍රාථමික පාසල් සිසුන් විසින් පෙන්නුම් කරනු ලබන ලිවීමේ දුෂ්කරතා පහක් (05) උදාහරණ සමගින් පැහැදිලි කරන්න. (ලකුණු 10 )

II. ඔබ ඉහත සඳහන් කළ දුෂ්කරතා දෙකක් (02) අවම කිරීම සඳහා ගුරුවරයෙකු වශයෙන් ගත යුතු ක්‍රියාමාර්ග තුන (03) බැගින් යෝජනා කරන්න. (ලකුණු 10 )

11. I. සුසාධ්‍යකාරකයෙකු ලෙස ගුරුවරයා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සිංහල භාෂාව ඉගැන්වීමේ අරමුණු කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමේ වැදගත්කම විමර්ශනය කරන්න. (ලකුණු 10 )

II. "ප්‍රාථමික සිසුන් තක්සේරු කිරීමේ ප්‍රධානම අභිමතාර්ථය විය යුත්තේ අනාවරණ හා උපදේශන කාර්යයන් ය." මෙම අදහස උදාහරණ ඉදිරිපත් කරමින් තහවුරු කරන්න.

(ලකුණු 10 )

12. I. "ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය හා ගුරුවරයාගේ භූමිකාව සිංහල භාෂාව ඉගැන්වීම හා සම්බන්ධ කරගෙන පැහැදිලි කරන්න. (ලකුණු 10 )

II. භාෂාව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී සුසාධ්‍යකරුවෙකු වශයෙන් ගුරුවරයාගේ ධනාත්මක ආකල්ප වැදගත් වන ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 10)

13. I. "විධිමත් තක්සේරුකරණය හා අවිධිමත් තක්සේරුකරණය" යන්න සිංහල භාෂා ඉගැන්වීම් ක්‍රියාවලිය ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10 )

II. භාෂා කුසලතා සංවර්ධනයෙහි ලා ප්‍රාථමික අධ්‍යාපනයේ වැදගත්කම තර්කානුකූලව පැහැදිලි කරන්න.

(ලකුණු 10)

*-සියලුම හිමිකම් ඇවිරිණි.-*